පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- නර්තනය - I, II

පාසලේ නම : ........................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03යි.

❖ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

❖ **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වලට දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

## I කොටස

❖ **අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න වල හිස්තැනට සුදුසු වචන තේරන්න.**

**01.** ආධුනික නර්තන ශිල්පියා ............. ලය අනුව සරඹ හැදෑරීම කළ යුතුය.
(1) සමගුණ, දෙගුණ, තුන්ගුණ (2) සමගුණ, දෙගුණ, සිව්ගුණ
(3) සමගුණ, දෙගුණ, මධ්‍යගුණ (4) විලම්භගුණ, මධ්‍යගුණ, සිව්ගුණ

**02.** ''තත්, දිත්, තොං, නං'' යන සතර බීජාක්ෂර ............. උපයෝගී කර ගෙන වාදනය කරයි.
(1) උඩරට බෙරය (2) පහතරට බෙරය (3) දවුල (4) තම්මැට්ටම

**03.** කෝලම් නාටක චරිත නිරූපණයේ එන .............. පූර්ව රංගයට අයත් කාන්තා චරිත වේ.
(1) ලෙන්චිනා හා නාගකන්‍යා කෝලම (2) නොංචි හා නාරිලතා කෝලම
(3) අණබෙර හා නොංචි කෝලම (4) ලෙන්චිනා හා නොංචි කෝලම

**04.** එක් වන්නමක් අවසන් වන පදයෙන් හෝ අක්ෂරයෙන් අනෙක් වන්නම ආරම්භ වීම ............... වන්නම් වල විශේෂ ලක්ෂණයකි.
(1) උඩරට (2) පහතරට (3) සබරගමු (4) නවතම

**05.** බලි ඇදුරා ශාන්තිකර්මයේ දී බලි ඇඳුරා දකුණු අතට ............... ගෙන තාලානුකූලව සරල නර්තනයක යෙදෙයි.
(1) පන්දම (2) පුවක් මල් කිණිත්ත (3) ඊ ගහ (4) අත්මිණිය

**06.** මුල්ම ප්‍රශස්ති කාව්‍ය ලෙස ................. නම් කළ හැක.
(1) ශෘංගාලංකාරය (2) ශ්‍රී නාමය (3) පැරකුම්බා සිරිත (4) නරේන්ද්‍රසිංහ වර්ණනාව

**07.** පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව පන්තේරුව ..............වාද්‍ය භාණ්ඩයකි
(1) ඝන (2) ආතත (3) විතතාතත (4) සුෂිර

**08.** ''දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට'' මෙම බෙර පදය මාත්‍රා ............. තාල රූපයට වාදනය කරයි.
(1) 4 + 4 (2) 2+2+3 (3) 2+2+4 (4) 3+4

09. ''මිනික්කු'' හා ''පච්චා'' යනු ............. නර්තනයේ වේශ නිරූපණ ක්‍රම 02කි.

(1) භරත (2) කතක් (3) කතකලි (4) මණිපුරි

10. වාදනයේ දී සුදු රෙදි කඩකින් බඳ ආවරණය කරමින් වාදනය කරනු ලබන්නේ ........... බෙරයයි.

(1) මද්දල (2) මෘදංග (3) පඛ්වාජ් (4) පුංග්

❖ 11 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

11. කොහොඹාකංකාරිය ශාන්තිකර්මයේ දක්නට ලැබෙන සැරසිලි වනුයේ,

(1) යහන, අයිලය හා කාලපන්දම් ගස ය (2) යහන, අයිලය හා තොරණ ය

(3) යහන, අයිලය හා යක්ගෙය ය (4) යහන, අයිලය හා බිසෝකප ය

12. බීභත්ස්‍ය, කරුණා, අද්භූත, රෞද්‍ර යන රස නිශ්පත්තියේ දී මූලික වන ස්ථායි භාවයන් වන්නේ,

(1) පුදුමය, ශෝකය, විශ්මය, භය (2) පිළිකුල, දුක, පුදුමය, භය

(3) ජුගුප්සා, ශෝක, විශ්මය, ක්‍රෝධ (4) පිළිකුල, ශෝක, ජුගුප්සා, ක්‍රෝධ

13. ප්‍රාසාංගික නර්තනයේ දී ශිල්පියාගේ බාහිර ස්වරූපය වෙනස් නොවන පරිදි වෙස් ගැන්වීම සිදු කරනු ලබන්නේ,

(1) බාහිර අංගරචනයේදී ය (2) ස්වාභාවික අංගරචනයේදී ය

(3) චරිතාංග අංගරචනයේදී ය (4) නිර්මාණාත්මක අංගරචනයේදී ය

14. ''නෙර්තමාලය'' නැමැති කෘතිය ප්‍රබන්ධ කර ඇත්තේ,

(1) ජේ.ඊ. සේදරමන් මහතා (2) ගණිතාලංකාර බමුණු පඬිවරයා

(3) රම්මොලවක අධිකාරම් තුමා (4) කිරිඇල්ලේ ඥාණවිමල හිමි

15. ප්‍රථම රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙල පවත්වන ලද වර්ෂය වන්නේ

(1) 1964 (2) 1961 (3) 1976 (4) 1943

16. ''බෙරහඬ'' නාට්‍ය නිර්මාණය කළ නිර්මාණකරුවා වන්නේ,

(1) විශාරද සුදත් සමරසිංහ මහතා (2) එස්. මහින්ද හිමි

(3) බන්දුල ගුණවර්ධන මහතා (4) චිත්‍රසේන ඩයස් මහතා

17. කෝලම් නාටකයේ පාත්‍ර වර්ගයා (නළුවන්) රඟමඬලට පිවිසෙන්නේ කුමක් පිටුපස සිට ද?

(1) මල්යහන (2) නේපත්‍යාගාරය (3) වෙස්අත්ත (4) අයිලය

18. කතකලි නර්තන සම්ප්‍රදායේ වේශ නිරූපණ ශිල්පියා හඳුන්වනු ලබන්නේ,

(1) මුත්තුකාරන් (2) පත්තුකාරන් (3) නට්ටුවනාර් (4) සිංකිඩි

19. මෝල්ගස් නර්තනය සඳහා ශාන්ති කර්මවල එන කුමන කවි වර්ගය භාවිතා කරන්නේ ද?

(1) බලි කවි (2) කඩතුරා කවි (3) ග්‍රහපන්ති කවි (4) අටමගලේ කවි

20. කොහොඹාකංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්ම තුනෙහි දක්නට ලැබෙන අංග වන්නේ,

(1) හත්පද, කප් සිටුවීම, මඩු පේ කිරීම (2) මඩු පේ කිරීම, දළුමුර පිදීම, යහන් දැක්ම

(3) හත්පද, අත්‍යාබෙර, කප් සිටුවීම (4) හත්පද, අයිලෙ යැදීම, කප් සිටුවීම

❖ **21 සිට 24 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර පහත වගුව ඇසුරෙන් තෝරන්න**

| | A | B | C |
|---|---|---|---|
| 1 | මුදියන්සේ දිසානායක | බන්දුල ගුණවර්ධන | ශ්‍රියානි රාජපක්ෂ |
| 2 | ලයනල් බෙන්තරගේ | ජයසේන කෝට්ටේගොඩ | සී.ඇස් ද කුලතිලක |
| 3 | ජේ.ඊ. සේදරමන් | වජිරා චිත්‍රසේන | අංජලිකා චිත්‍රසේන |

**21.** නර්තන විෂයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබාගත් ප්‍රථම ලාංකිකයා වන්නේ,

(1) 1 පේළියේ A (2) 2 පේළියේ B (3) 3 පේළියේ A (4) 2 පේළියේ C

**22.** ''සමන් දේවාල පුදසිරිත්'' නැමැති කෘතිය රචනා කරන ලද්දේ,

(1) 2 පේළියේ A (2) 1 පේළියේ B (3) 1 පේළියේ C (4) 3 පේළියේ C

**23.** සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ ප්‍රථම උපකුලපති වශයෙන් සේවය කරන ලද්දේ

(1) 2 පේළියේ A (2) 2 පේළියේ B (3) 3 පේළියේ A (4) 1 පේළියේ A

**24.** ළමා මුද්‍රා නාට්‍ය කලාවක් හඳුන්වාදීමේ ගෞරවය හිමිවන්නේ

(1) 1 පේළියේ C (2) 2 පේළියේ A (3) 3 පේළියේ C (4) 3 පේළියේ B

❖ **25 සිට 40 දක්වා නිවැරදි පිළිතුර තෝරන්න**

**25.**



A B C

ඉහත A, B, C යන රූප මගින් පිළිබිඹු වන රස පිළිවෙලින්,

(1) හාස්‍ය රසය, වීර රසය, අද්භුත රසය (2) හාස්‍ය රසය, රෞද්‍ර රසය, ශෝක රසය

(3) ශෘංගාර රසය, වීර රසය, ශාන්ත රසය (4) ශාංගාර රසය, හාස්‍ය රසය, ශාන්ත රසය

**26.** රජයේ ලලිත කලායතනය හා සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කළ වර්ෂ පිළිවෙලින්,

(1) 1943 හා 1952 (2) 1952 හා 1956 (3) 1956 හා 1952 (4) 1936 හා 1972

**27.** ''වාසනා දිනේකි මේක පාමු තුටින්......'' යන නාට්‍ය ගීතය සඳහා නර්තන නිර්මාණයේ දී වඩාත් යෝග්‍ය වන්නේ,

(1) ස්ථිතික චලන හා සංචාරී චලන (2) රිද්මයානුකුල චලන හා සංචාරී චලන

(3) ස්ථිතික චලන හා තාලානුකුල චලන (4) අභිචලන හා තාලානුකුල චලන

**28.** ඇදහිලි හා විශ්වාස අතින් සමානතාවයක් දක්වන ශාන්තිකර්ම දෙක වන්නේ,

(1) කොහොඹාකංකාරිය හා දෙවොල් මඩුව (2) දෙවොල් මඩුව හා පහන් මඩුව

(3) කොහොඹාකංකාරිය හා පහන් මඩුව (4) පහන් මඩුව හා කඩවර කංකාරිය

**29.** මනිපුරි නර්තනයේ ''චාලි'' අභ්‍යාස වල සුවිශේෂ පද කොටස් හඳුන්වනු ලබන නාමය වන්නේ,

(1) පරෙංග් (2) පුංග් චොලම් (3) සංකීර්තන් (4) කර්තාල්චොලම්

**30.** ශාන්ති කර්මවල භාවිතා කෙරෙන දෙබස් හා සංවාද අයත් වන්නේ,

(1) ආංගික අභිනයට ය (2) සාත්වික අභිනයට ය

(3) ආහාර්ය අභිනයට ය (4) වාචික අභිනයට ය

## II කොටස - උඩරට නර්තනය

31. ''තකට තකට තක තරිකිට කුඳ කුඳ තා තක පිපිකුඳ ..........'' යන කස්තිරම අයත් වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,

(1) දෑත පෑගීමේ සරඹය (2) පැනීම් සරඹය (3) බඹර සරඹය (4) චන්ද්‍රිකා සරඹය

32. ''රනේ රුවසේ වත රුවින් දිලේ දෝ........'' මෙම කවියේ දෙවන පදය වන්නේ,

(1) රනේ බරන ගත වට සරසාදෝ (2) රනේ ඔසරි පොට නෙරිය තබාදෝ

(3) රනේ දෙකොන විලි මෝල ගෙනේ දෝ (4) රන්විලි දෙකොනට සොඳින් බඳීදෝ

33. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලි දෙකකි.

(1) අඹ විදමන හා යක්කම් පහ (2) යක්කම් පහ හා ගුරුගේ මාලාව

(3) යක්කම් පහ හා දුනුමාලප්පුව (4) පොත්කඩේ පාලිය හා ගබඩාකොල්ලය

34.







ඉහත ඡායාරූපවල දැක්වෙන ග්‍රන්ථ කතුවරුන් තිදෙනා පිළිවෙලින්,

(1) තිස්ස කාරියවසම්, මුදියන්සේ දිනාසායක, ජයසේන කෝට්ටේගොඩ

(2) මුදියන්සේ දිසානායක, තිස්ස කාරියවසම්, ලයනල් බෙන්තරගේ

(3) මුදියන්සේ දිසානායක, ලයනල් බෙන්තරගේ, ආරියරත්න කළුආරච්චි

(4) මුදියන්සේ දිසානායක, තිස්ස කාරියවසම්, ජයසේන කෝට්ටේගොඩ

35. ''තාං ජිං තත් තත් ජිං තත් ජිං තත් තත්.........'' මෙම අඩව්ව අයත් වන්නේ,

(1) සැවුලා වන්නමටය (2) කුඳාංත ගත දොම් වට්ටමටය

(3) දොංජිංත ගත දොංත වට්ටමටය (4) මුසලඩි වන්නමටය

36. නර්තන නිර්මාණයේ දී සැලකිලිමත් නොවිය යුතු කරුණක් වන්නේ,

(1) තාලය, රිද්මය, ප්‍රකාශනය පිළිබඳ අවධානය යොමු කිරීම

(2) සාමූහිකත්වයෙන් නර්තනය නිර්මාණය කිරීම

(3) රංග වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වීම

(4) සාම්ප්‍රදායික බව

37. සතර බීජාක්ෂර වාදනයේ දී දකුණු බෙර ඇසට තදින් හඬ පුපුරා යන අයුරින් වාදනය කරන අක්ෂරය වන්නේ,

(1) ජිත් (2) තොං (3) තත් (4) නං

38. සොකරි නාටකයේ දක්නට ලැබෙන චරිත වන්නේ,

(1) ආඬිගුරු, පරයා. සොත්තානා, වෙදරාල (2) සොකරි, ගුරුහාමි, ආරච්චි, සොත්තානා

(3) ගුරුහාමි, සොකරි, පරයා, පුරන්සිනා (4) ලෙන්චිනා, සොකරි, වෙදරාල, හෙන්චා

39. මැදුම් මහ දෙතිතේ තාල රූපය හතර වරක් වාදනය කිරීමේ දී එයට අයත් සම්පූර්ණ මාත්‍රා ගණන වන්නේ,

(1) මාත්‍රා 07 කි (2) මාත්‍රා 14 කි (3) මාත්‍රා 28 කි (4) මාත්‍රා 21 කි

40. ''කුඳාංත ගත කුඳ දොම්කිට තරිකිට කුංදත් තා'' මෙම පද කොටස නර්තනය කරනු ලබන තාල රූපය වන්නේ,

(1) දෙසුළු මැදුම් තුන්තිත (2) දෙසුළු මහ තුන්තිත (3) මහ තනිතිත (4) මැදුම් මහ දෙතිත

## II පත්‍රය

- ❖ **පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**
- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01. **සියලුම** ප්‍රශ්න වලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකයයොදා ඉදිරියෙන් ලියන්න.**

i. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ තරඟකාරිත්වයෙන් යුතු වාදන අංගය .................................................. වාදනය ලෙස හඳුන්වයි.

ii. ''පෙර සිට පැවත එන - සිරිතට පොදිය බැඳගෙන.......'' මෙය කෝලම් නාටකයේ .................................... කෝලමට අයත් කවි පද කොටසකි.

iii. රේඛා, හැඩතල සහ සමබරතාවය යන මූලධර්ම නර්තන කලාවට මෙන්ම ............................ කලාවට ද වැදගත් වේ.

iv. අතීතයේ දී සම්ප්‍රදායන් තුනේම වන්නම් රචනා වී ඇත්තේ ....................................... සඳහා ය.

v. රාජ ආඥාවක් සන්නිවේදනය කිරීමට අතීතයේ දී ...................................... වාදනය කරන ලදි.

vi. අංගරචනයේ දී මුහුණ කොටස් ...................................... කට බෙදාගත යුතුය.

vii. 1972 වර්ෂයේ දී සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ..................................................... විද්‍යාලය ආරම්භ කරන ලදි.

viii. ප්‍රාසාංගික බව තීව්‍ර කිරීමට යොදා ගන්නා රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ ...................................... අභිනයනට ය.

ix. පහත සඳහන් නර්තනාංග ඇතුළත් නර්තන සම්ප්‍රදායන් ලියා දක්වන්න
(අ) කුඩි අට්ටම් : ................................................ (ආ) රාස්ලීලා : .......................................

x. සැළලිහිණිය, කුඹුරුපනත යන මුද්‍රා නාට්‍ය නිර්මාණය කළ ප්‍රවීණ කලාකරුවන් දෙදෙනා වන්නේ,
(අ) සැළලිහිණිය : ............................................ (ආ) කුඹුරුපනත : ................................

(ල. 1 x 12)

02. i. දෙතිතේ ප්‍රභේදයකට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ල. 04)

ii. ''ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට - හිරු දෙවි අධිපති වන්නේ'' යන කවි පදය අදාළ තිත් රූපයට ප්‍රස්ථාර කරන්න (ල. 04)

iii. සැවුලා වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ල. 04)

**03.** පහත සඳහන් මාතෘකා අතරින් 03ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න

i. අංග රචනය

ii. මිරැන්ඩා හේමලතා

iii. හටන් කවි

iv. සතර අභිනය

(ල. 4 x 3)

**04.** ශාන්ති කර්ම වලට ආවේණික වූ ගායනා, නාට්‍යමය පෙළපාළි සහ ඇඳුම් පැළඳුම් වලින් ඒවායේ සමාජ පසුබිම පිළිබඳව තොරතුරු විවරණය කෙරේ.

i. කොහොඹාකංකාරි ශාන්තිකර්මයේ නාට්‍යමය අවස්ථා දෙකක් නම් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 04)

ii. දෙවොල් මඩුවේ හා පහන් මඩුවේ චාරිත්‍රවල සමානතා පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 04)

iii. පහතරට දෙවොල් මඩු ශාන්තිකර්මයේ එන කතා පුවතින් සමාජ විවරණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න. (ල. 04)

**05.** ශ්‍රී ලාංකීය වාද්‍ය භාණ්ඩ විවිධ වූ සන්නිවේදන කාර්යභාරයන්ට යොදාගත් බව ඓතිහාසික තොරතුරු මගින් ගම්‍ය වේ.

i. ආගමික වත් පිළිවෙත්හි වාදන අවස්ථා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල. 04)

ii. රාජ්‍ය පාලකයන්ගේ කාර්යභාරයන් සඳහා වාදනය යොදාගත් ආකාරය සාකච්ඡා කරන්න. (ල. 04)

iii. වර්තමානයේ සමාජ උත්සව සඳහා වාද්‍ය සන්නිවේදන කාර්යභාරය විමසුමට ලක් කරන්න. (ල. 04)

**06.**




A



B



C

i. A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය නම් කර රංග වස්ත්‍රාභරණ 03ක් ලියා දක්වන්න. (ල. 04)

ii. C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳ විස්තරයක් කරන්න. (ල. 04)

iii. B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංග 02ක් නම් කර ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ල. 04)

**07.** i. මානසික ස්වස්ථතාවය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල. 04)

ii. නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියා පිළිබඳ විමසීමක් කරන්න. (ල. 04)

iii. යහපත් දිවි පැවැත්ම සඳහා නර්තන කලාව හා බැඳි සාරධර්ම වැදගත් වන ආකාරය විස්තර කරන්න. (ල. 04)